# <u>ටෙන්ඩර්කරුවන්ට උපදෙස් හා කොන්දේසි</u>

කර්මාන්ත හා වාණිජ කටයුතු, දීර්ඝ කාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීමේ හා සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයට අයත් උතුරු මැද පළාත් ප්‍රාදේශීය කර්මාන්ත සේවා මධ්‍යස්ථානය අනුරාධපුරය නගර සීමාව තුළ හෝ තදාසන්න ස්ථානයක පිහිටුවීම සඳහා තීරණය කර ඇත. මෙම කාර්යාලයට සුදුසු ගොඩනැගිල්ලක් කුලියට ගැනීම සඳහා පහත දැක්වෙන කොන්දේසි වලට අනුකූලව මිල ගණන් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් විසින් පහත සඳහන් අවශ්‍යතා සපුරා තිබිය යුතුය.

I. නල ජලය, විදුලිය, දුරකථන පහසුකම් හා සනීපාරක්ෂක පහසුකම් තිබීම.
II. කාර්යාලීය ඉඩකඩ, අවම වශයෙන් වර්ග අඩි 1500-2000ත් අතර ප්‍රමාණයක් තිබිය යුතු වේ.
III. අයදුම්කරුට අදාල ගොඩනැගිල්ල පිළිබඳව නීත්‍යානුකූල අයිතිය තිබීම හා එය සනාථ කිරීමට හැකි වීම.
IV. ප්‍රධාන මාර්ග වලට මුහුණලා පිහිටීම හා ජනතාවට එම ස්ථානයට පහසුවෙන් ළඟා වීමේ හැකියාව.
V. අවම වශයෙන් වාහන තුනක් නවතා තැබීමට ප්‍රමාණවත් ඉඩ පහසුකම් තිබීම.

02. අයදුම්පත් රු. 500/-ක මුදලක් ගෙවීමෙන් උතුරු මැද පළාත් ප්‍රාදේශීය කර්මාන්ත සේවා මධ්‍යස්ථානය, අංක 624/11, ගොඩගේ මාවත, අනුරාධපුරය ලිපිනය හෝ කර්මාන්ත හා වාණිජ කටයුතු, දීර්ඝ කාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීමේ හා සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන අංශයෙන් 2019/03/15 දින පෙ. ව. 10.00 දක්වා ලබා ගත හැක.

03. මිල ගණන් භාර ගන්නා අවසාන දිනය 2019/03/15 දින ප. ව. 02.00 දක්වා පමණි.

04. ඉදිරිපත් කළ මිල ගණන් කුලී ගිවිසුම අත්සන් කළ දින සිට වර්ෂ තුන (දින 1095)ක කාලයක් සඳහා වලංගු වේ.

05. කුලී හිමියා මේ සඳහා මිල ගණන් ඉදිරිපත් කරන අවස්ථාව වන විට අදාල ගොඩනැගිල්ල භාවිතා කළ හැකි ආකාරයෙන් ඉදිකිරීමේ කටයුතු සම්පූර්ණයෙන් ම නිම කර ඇති ගොඩනැගිල්ලක් විය යුතුය.

06. කුලී හිමියා විසින් ගොඩනැගිල්ලේ නඩත්තු කටයුතු සිදු කළ යුතුය.

07. කුලී හිමියා වෙත අත්තිකාරම් මුදල් ගෙවනු නොලබන අතර, මාසිකව කුලී මුදල් ගෙවනු ලැබේ.

08. ඉදිරිපත් කරන මිල ගණන් සීල් තබන ලද කවරයක බහා පහත සඳහන් ලිපිනයට මිල යෝජනා ලබා ගැනීමේ අවසන් දින (2019/03/15 ප.ව. 02.00)ට ප්‍රථමව ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට හෝ හැකිය. ටෙන්ඩර්පත් බහා එවනු ලබන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ "<u>උතුරු මැද පළාත් ප්‍රාදේශීය කාර්යාලය සඳහා මිල ගණන්</u>" යනුවෙන් සඳහන් කළ යුතුය.

ලිපිනය : සභාපති,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,
කර්මාන්ත හා වාණිජ කටයුතු, දීර්ඝ කාලීනව අවතැන් වූ
පුද්ගලයන් නැවත පදිංචි කිරීමේ හා සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය,
අංක 73/1, ගාලු පාර,
කොළඹ 03.

වැඩි විස්තර සඳහා දුරකථන අංකය - 011-2347392

**<u>සැලකිය යුතුයි.</u>**

ප්‍රමාද වී ලැබෙන මිල ගණන් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මිල ගණන් ලබා ගැනීමේ වේලාව අවසන් වූ වහාම අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන අංශයේ දී මිල ගණන් විවෘත කරනු ලැබේ. එම අවස්ථාවට අයදුම්කරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගී විය හැකිය. සුදුසු කාර්යාලීය ගොඩනැගිල්ලක් තෝරා ගැනීම පිළිබඳ අවසන් තීරණය අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව සතු වේ.